# සමලිංගික ඇබ්බැහිය හා පවතින අන්තර් සංස්කෘතික ලක්ෂණ

අසිත මල්ලවආරච්චි*

සමලිංගික චර්යාව යනු මානව ඉතිහාසය තරම්ම පැරණි දෙයකි. කෙසේ වෙතත් බොහෝ මානව සමාජයන්හිදි මෙම චර්යාව ප්‍රතික්ෂේප කරන ලද්දේ සමාජ සම්මතයෙන් බැහැර වූවක් ලෙස සලකමින්ය. වර්තමානය වන විට ලෝකයේ විවිධ රටවල් පිළිගත් සම්මත ලිංගික චර්යාවක් ලෙස සලකන නමුත් ශ්‍රී ලංකාව ඇතුළු බොහෝ රටවල් ප්‍රමාණයක් සමලිංගිකත්වය අසම්මත චර්යාවක් ලෙස සලකා පිටු දැක ඇත.

මෙම පර්යේෂණයේ අරමුණ වන්නේ, සමලිංගික ඇසුරට යොමු වූවන් තුළ පවතින චර්යා රටාවන් හඳුනාගැනීම හා ඔවුන්ගේ පුද්ගලාන්තර සන්නිවේදන රටාවන් ඇතුළු අන්තර් සංස්කෘතික ලක්ෂණ අධ්‍යයනය කිරීම යි. ඒ අනුව මෙම අධ්‍යයනයේ පර්යේෂණ ගැටලුව වන්නේ, **සමලිංගික ඇසුරට යොමු වූවන් තුළ පවතින අන්තර් සංස්කෘතික ලක්ෂණ මොනවාද?** යන්නයි. එම පර්යේෂණ ගැටලුවට ගොඩනගන ලද උපන්‍යාසය වන්නේ, සමලිංගික ඇසුරට යොමු වූවන් එකිනෙකා හා සහසම්බන්ධ වීමට අන්තර් සංස්කෘතික ලක්ෂණ පදනම් කරගන්නා බවයි. මෙහිදි පර්යේෂණයට අදාළ දත්ත රැස්කිරීම සඳහා ප්‍රාථමික දත්ත ලෙස නිරීක්ෂණය හා සම්මුඛ සාකච්ඡා ක්‍රමය යොදා ගත්තේය. ද්විතීයික දත්ත ලෙස පුස්තකාල පොත්, පුවත්පත් හා අන්තර්ජාලය යොදා ගත්තේය. පර්යේෂණයට බඳුන්කරන ලද අධ්‍යයන ක්ෂේත්‍රය ලෙස, වයඹ පළාතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ කුරුණෑගල නගරය තුළ 2014.04.01 දින සිට 2014.07.31 දක්වා කාල සීමාව තුළ සමලිංගික ඇසුර පවත්වන ලද පිරිමි අයගෙන් අහඹු ලෙස තෝරාගත් 50 දෙනෙක් තෝරාගන්නා ලදි.

මෙම අධ්‍යයනය තුළින් ලබා ගන්නා ලද පොදු නිගමන වන්නේ ළමා අවධියේ ලත් අත්දැකීම් අනුව ඔවුන් සමලිංගික ඇසුරට යොමු වූවත්, පසුව එය පවත්වා ගෙන යාම සඳහා පොදු සංස්කෘතික රටාවකට අනුගතව ඇති බවයි. එහිදි ඔවුනොවුන් ඇසුරු කිරීමට බහු සන්නිවේදන රටා භාවිත කරන අතර එහිදි ඔවුන්ටම ආවේණික චර්යා රටාවන් පැහැදිලිව දැකිය හැකි බවයි.

**ප්‍රමුඛ පද** - සමලිංගිකත්වය, සංස්කෘතිය, සන්නිවේදනය,චර්යාරටා